# සාමාන්‍ය සමයේ විසිදෙවන සතිය
# බදාදා

## පළමුවන දේව ප්‍රකාශනය

ශුද්ධවූ පාවුලු තුමන් විසින් කොලොස්සිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

කොලොස්සි 1: 1-8

"ඔබ වෙත මෙන්ම මුළු ලොව පුරා ඒ සුබ අස්න පැතිරෙමින් පවතී."

දේව කැමැත්ත අනුව ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ අපෝස්තුළුවරුන් වන පාවුලු ද සහෝදර තිමෝතියස් ද යන අපි, කොලොස්සියේ සිටින ක්‍රිස්තියානි ඇදහිලිවන්ත සහෝදර සැදැහැවතුන් වෙත ලියා එවමු. අප පියාණන් වන දෙවියන් වහන්සේගෙන් කරුණාවත් ශාන්තියත් ඔබ හට වේවා!

අපගේ යාච්ඤාවල දී, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පියාණන් වන දෙවියන් වහන්සේට, අපි ඔබ උදෙසා නොකඩවා තුති දෙමු. මන්ද, ඔබගේ ක්‍රිස්තියානි ඇදහිල්ලත්, සියලු සැදැහැවතුන් කෙරෙහි පවත්නා ඔබේ ප්‍රේමයත් ගැන අප අසා ඇති බැවිනි. ඒ දෙකට හේතු වූ ඔබගේ ස්වර්ගීය බලාපොරොත්තුව ගැන පළමුවෙන් ඔබට අසන්නට ලැබුණේ, සත්‍ය සුබ අස්නේ දහම් පණිවුඩය ඔබ වෙත පැමිණි විට ය. ඔබ වෙතට මෙන් ම මුළු ලෝකය වෙතට ද ඒ සුබ අස්න පැමිණ තිබේ. තවද, ඔබ එය අසා දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය නිසි පරිදි අවබෝධ කරගත් දා පටන්, එය ඔබ අතර පල දරා, වර්ධනය වූවාක් මෙන්, ලොව පුරා එය පල දරමින් වර්ධනය වන්නේ ය.

අපගේ ප්‍රේමවන්ත හවුල්කාරයකු ද ක්‍රිස්තුස් වහන්සේගේ විශ්වාසවන්ත සේවකයකු ද වන එපප්‍රස් අප වෙනුවෙන් ඒ සුබ අස්න ඔබට ඉගැන්වී ය. ආත්මයාණන්ගෙන් වූ ඔබේ ප්‍රේමය ගැන අපට සැළ කළේත් ඔහු ය.

දේව වචනය මෙසේ ය

## පිළිතුරු ගීය

ගීතාවලිය 52 : 8-9

පිළිතුර: මම දෙව් පෙම තුළ සදහට ම විශ්වාසය තබන්නෙමි.

ගීය:

මම වනාහි දෙව් විමනෙහි සරුසාර ඔලීව ගසක් මෙන් වන්නෙමි.
දෙව් පෙම තුළ සදහට ම විශ්වාසය තබන්නෙමි.

ඔබ එසේ කළ බැවින් මම සදහට ම ඔබ පසසන්නෙමි. ඔබේ සැදැහැවතුන් අබිමුව ඔබේ නම යහපත් ය. එබැවින් මම එය පතුරා හරින්නෙමි.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
දිළිඳුන් හට සුබාරංචිය ප්‍රකාශ කිරීමට ද,
වහලුන්ට මිදීම ලබා දීමට ද සමිඳාණෝ මා එවා වදාළ සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
සමිඳුන්ගේ වචනය සදහටම පවතින්නේය.
මේ වචනය නම් ඔබට දේශනා කරන ලද සුබ අස්න ය.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ලූක් 4: 38-44

"මා වෙනත් නුවරවල ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය පිළිබඳ සුබ අස්න දේශනා කළ යුතුය."

ජේසුස් ස්වාමීන් වහන්සේ ධර්ම ශාලාවෙන් නැගිට ගොස් සීමොන්ගේ ගෙදරට ඇතුල් වූ සේක. සීමොන්ගේ බිරිඳගේ මවට බලවත් උණ රෝගයක් වැළඳී තිබිණි. ඔව්හු ඇ උදෙසා උන්වහන්සේට කන්නලව් කළහ. උන්වහන්සේ ද ඇ ළඟ සිට උණ රෝගය පහව යන්නට අණ කළ සේක. උණ රෝගය ඇගෙන් පහව ගියේ ය. එකෙණෙහිම ඇ නැගිට ඔවුන්ට උපස්ථාන කළා ය.

හිරු බැස යද්දී නොයෙක් රෝගවලින් පීඩිත වූ අය භාරව සිටි සියල්ලෝම උන්වහන්සේ වෙත ඔවුන් ගෙනාහ. උන්වහන්සේ එකිනෙකා පිට අත තබා ඔවුන් සුවපත් කළ සේක. යක්ෂයෝ ද, "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය"යි බෙරිහන් දෙමින් බොහෝ දෙනෙකුගෙන් දුරු වූහ. තමන් ක්‍රිස්තුස් වහන්සේ ය"යි ඔවුන් දැන සිටි නිසා උන්වහන්සේ ඔවුන්ට තරවටු කොට, කතා කිරීම තහනම් කළ සේක. පසු දින පහන් වූ කල උන්වහන්සේ පිටත්ව හුදකලා තැනකට වැඩිය සේක. සමූහයා උන්වහන්සේ සොයා ගොස් හමු වූ පසු තමන් වෙතින් යන්නට නොදී උන්වහන්සේ නවතා ගන්නට තැත් කළහ. උන්වහන්සේ කතා කොට, "මා වෙනත් නුවරවල ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය පිළිබඳ සුබ අස්න දේශනා කළ යුතුය. මා එවන ලද්දේ ඒ සඳහා ය"යි ඔවුන්ට වදාළ සේක. තවද, උන්වහන්සේ ජුදයේ ධර්ම ශාලාවල දේශනා කරමින් සිටි සේක.

සමිඳාණන් වහන්ගේ සුභාරංචිය මෙසේ ය